කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

නීති පීඨය

නීතිවේදී උපාධි පරීක්ෂණය, ප්‍රථම වසර - 2017

# ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය

පැ තුනයි (03)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව: 07

ඕනෑම ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

(අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.)

---

01. එක් අතකින්, සිතීමේ, හෘද සාක්ෂියේ සහ ආගමික නිදහසට ඇති අයිතිය සහතික කර තිබෙන පරිසරයක් තුළ, සංස්කෘතික සංවේදීතාවය සහ ජනවාර්ගික විශ්වාසයන් හා සම්බන්ධිත නෛතික කරුණු ප්‍රවේශම්සහගතව ආමන්ත්‍රණය කළ යුතුය. අනික් අතට නීති සම්පාදන ක්‍රියාවලිය තුළ, බහුවිධ නීති පද්ධතියක ඇති ශක්තීන් සහ අඩප්‍රස්ථාවන් අගය කළ යුතුය. එසේහෙයින්, බහුවිධ නීති පද්ධතියක් තුළ, නීතිය ප්‍රතිසංස්කරණය කිරීම, සැබෑ අභියෝගයකි.

    ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය ආශ්‍රයෙන්, ඉහත ප්‍රකාශයෙහි වලංගුතාවය තක්සේරු කරන්න. ඔබේ පිළිතුර අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන, ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා නඩුතීන්දු ඇසුරින් තහවුරු කළ යුතුය.

02. කමල්ගේ එකම දරුවා වන දොළොස් වියැති තරුෂි, බීමත් රියදුරෙකු සිදුකළ රිය අනතුරකින් මරණයට පත්විය. දරු ප්‍රසූතිය අතරතුරදී සිදුවූ ඔහුගේ භාර්යාවගේ මරණයෙන් පසුව, කමල් ඔහුගේ දියණිය හදාවඩා ගැනීම සඳහා ඔහුගේ මුළු ජීවිතයම කැප කර තිබුණි. තම දියණියගේ මරණය නිසා හටගත් කම්පනයෙන්, කමල් තවමත් පීඩා විඳිමින් සිටියි. තරුෂිගේ මරණයේ ප්‍රතිපලයක් වශයෙන්, ඇයගේ අවධානය සහ සමාගමය අහිමිවීම (Loss of care and companionship) නිසා, ඔහු අත්විඳි වේදනාවන් සඳහා වන්දි යාචනය කරමින්, ඔහු කොළඹ දිසා අධිකරණයේ නඩුවක් පවරා තිබේ.

ඔබ කමල්ගේ නීතිඥවරයා යැයි උපකල්පනය කරන්න. කමල්ගේ හිමිකම්පෑම සම්බන්ධයෙන් පක්ෂව සහ විපක්ෂව අධිකරණයේ දී ඉදිරිපත් කළ හැකි නෛතික තර්ක මොනවාද? ඔබේ තර්කනයන් අදාළ අධිකාරීන් ඇසුරින් තහවුරු කළ යුතුය.

03. "ඉංග්‍රීසි නීතිය සහ රෝම ලන්දේසි නීතිය, ශ්‍රී ලංකාව තුළ පවතින විදේශීය පද්ධතීන් වන අතර, සුවිශේෂී අවස්ථාවකදී ඒ දෙක අතරින් කරන තෝරාගැනීම අව්‍යාජයෙන්, වරණාත්මක සහ උපයෝගීතාවයෙන් යුත් දෙයක් විය යුතුය."

L.J.M. Cooray, 'An Introduction to the Legal System of Sri Lanka', (Stamford Lake, 2013) at p. 42.

ඉහත ප්‍රකාශය ඇසුරින්, ශ්‍රීලංකාවේ නීති පද්ධතිය රෝම ලන්දේසි නීතිය වෙනුවට ඉංග්‍රීසි නීතිය තෝරාගත් ක්ෂේත්‍රයන් කවරේද යන්න සාකච්ඡා කරන්න.

04. විවාහක මුස්ලිම් යුවලක් වන රහීම් සහ සාරා, දියණියක් දරුකමට හදාගත් අතර, ඇයට අදීරා යනුවෙන් නම් තැබුහ. ඔවුන්ට දරුකමට හදාගත් දියණියට වඩා වයසින් වැඩි, තමන්ට දාව උපත ලැබූ පුතුන් (Biological sons) දෙදෙනෙකුද සිටිති. දරුකමට හදාගැනීමේ සිද්ධියෙන් වසර 20 කට පසුව, රහීම් අනතුරකට මුහුණදුන් අතර, ඔහු එයින් දැඩි ලෙස තුවාල ලබා සිටී. රහීම් ඔවුන්ගේ අවිවාහක දියණිය අදීරාගේ අනාගතය පිළිබඳව දැඩි තැවුලකින් පසුවේ.

රහීම් සහ සාරා, ඔවුන්ගේ දරුවන් තිදෙනා අතර ඔවුන්ගේ දේපළ සමානව බෙදා වෙන් කෙරෙන බවට තහවුරු කරගත හැක්කේ කෙසේද යන්න පිළිබඳව, ඔබගේ උපදෙස් අපේක්ෂා කරති. අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා නඩුතීන්දු සඳහන් කරමින් ඔවුන්ට උපදෙස් දෙන්න.

05. මිතුරකුගේ උපන්දින සාදයක දී, නෙලුම් සහ අර්ජුන මුණගැසුණු අතර, එකිනෙකා දුටු පළමු මොහොතේම, ඔවුහු ප්‍රේමයෙන් බැඳුණහ. නෙලුම්, ඉතා ධනවත් උඩරට පවුලක එකම දරුවා වූ අතර, ඇය මාතලේ ප්‍රදේශයේ වාසය කරන්නීය. අර්ජුන තම දෙමාපියන් සමග නුවර පදිංචිව සිටින කෘෂිකර්ම නිලධාරියෙකි. අර්ජුනගේ පියා වන සිරිපාල, ගාල්ලේ උපත ලද අතර, පසුව ඔහුගේ රැකියාව හේතුකරගෙන ඔහුගේ පවුලේ අය සමග නුවර පදිංචියට පැමිණියේය. තම දෙමාපියන්ගේ ආශීර්වාදය ඇතිව විවාහ වීමට නෙලුම් සහ අර්ජුන තීරණය කළෝය.

නෙලුම් පවුලේ එකම දරුවා වූ බැවින්, එම දෙපළ මාතලේ පදිංචි වී, ඔවුන්ගේ කෘෂිකාර්මික දේපළ වැඩිදියුණු කිරීම ඇගේ දෙමාපියන්ට අවශ්‍යව ඇත. අර්ජුනගේ දෙමාපියන්ද මේ තීරණය සම්බන්ධයෙන් සතුටු වූ අතර, නෙලුම් සහ අර්ජුන වෙනුවෙන් චාරිත්‍රානුකූල විවාහයක් (Customary Marriage) සූදානම් කිරීමට ඔවුන්ට අවශ්‍යව ඇත. එකී යෝජනාව පිළිබඳව නෙලුම්ගේ දෙමාපියන් සතුටු නොවූ අතර, ඔවුන්ට අර්ජුන සහ නෙලුම්, තම විවාහය, බින්න විවාහයක් ලෙස ලියාපදිංචි කිරීමට අවශ්‍යව ඇත.

ඔවුනොවුන්ගේ දෙමාපියන් විසින් සිදුකරන යෝජනාවන්හි පවතින සම්භාවිතාව සහ නෛතික ප්‍රතිවිපාකයන් පිළිබඳව, නෙලුම්ට සහ අර්ජුනට උපදෙස් දෙන්න. ඔබේ පිළිතුර අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා නඩුතීන්දු නීතිය ඇසුරින් තහවුරු කළ යුතුය.

06. යාපනයේ ද්‍රවිඩ දෙමාපියන්ට දාව උපත ලද බාලා, 1990 දී, බාමිණී සමග විවාහ විය. විවාහයෙන් පසුව බාලාගේ මාමා සමග ජීවත් වීම පිණිස කැනඩාවට යාමට බාලා සහ බාමිණී තීරණය කළෝය. 2000 වසරින් පසුව, බාලා වසර දෙකකට වරක් යාපනයේ සංචාරය කිරීමට පටන් ගත්තේය. බාලා තම ඉගෙනගත් යාපනයේ පිහිටි පාසලේ ශ්‍රවණාගාරයක් ඉදිකළේය. බාලාගේ දෙමාපියන් ඔවුන්ගේ අභාවයට පෙර, යාපනයේ පිහිටි ඔවුන්ගේ නිවස බාලාට තෑගි කළෝය. බාලා අපනයන ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා ප්‍රාග්ධනය උපයාගැනීමට මෙම නිවස උගස් කළේය. අපනයන ව්‍යාපාරය සඳහා කාර්යාලයක් ගොඩනැගීමේ චේතනාවෙන් යුතුව ඔහු වැල්ලවත්ත

ප්‍රදේශයෙන් ඉඩමක් මිලදී ගත්තේය. 2015 දී, බාලා අන්තිම කැමති පත්‍රයක් රහිතව හදිසියේම මිය ගියේය.

ඔවුන් තේසවලමේ නීතියෙන් පාලනය නොවන හෙයින්, බාලාගේ දේපළ සාමාන්‍ය නීතිය යටතේ බෙදා වෙන් කළ යුතු බව බාමිණී හිමිකම් පාමින් කියා සිටින් නීය. අදාළ අධිකාරීන් උපුටා දක්වමින් ඇයට උපදෙස් දෙන්න.

07. පහත දක්වා ඇති නඩු විභාග කිරීම පිණිස අධිකරණ බලය ඇත්තේ කුමන අධිකරණයටද/ විනිශ්චක සභාවට ද යන්න පිළිබඳව උපදෙස් ලබාදීම, ඔබගෙන් අපේක්ෂා කෙරේ. ඒ එක් එක් අවස්ථාව සඳහා පවතින නෛතික ක්‍රියාමාර්ගයෙහි/ප්‍රතිකර්මයෙහි ස්වාභාවය සාකච්ඡා කිරීම ද ඔබගෙන් අපේක්ෂා කෙරේ. ඔබගේ පිළිතුර අදාළ අධිකාරීන් ඇසුරින් තහවුරු කළ යුතුය.

(අ) රවී සහ රාධා 2007 වසරේදී සාමාන්‍ය නීතිය යටතේ විවාහ ගිවිසුමකට එළඹුණු අතර, ඔවුන්ගේ වෛවාහක නිවස කොළඹ ප්‍රදේශයේ පිහිටුවා ගත්හ. රවීගේ මත්ද්‍රව්‍ය පානයට ඇබ්බැහිවීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස සිදුවූ ලිංගික අපයෝජනයන් හේතුකරගෙන, 2016 වසරේදී, රාධාට වෛවාහක නිවසින් පිට වී යාමට සිදුවිය.

(ආ) ලලිත්, ඔහුගේ කාර්යාලයට යන අතරමගදී, පොලිස් අත්අඩංගුවට පත් විය. දෙසතියකට පෙර සිදුවූ මිනීමැරුම් සිද්ධියක, එක් සැකකරුවකු ලෙස ඔහුව ළඟ තිබූ පොලිස් ස්ථානයකට ගෙන යන ලදී. ඔහුව දින පහළොවක් පොලිස් භාරයේ තබාගත් අතර, බරපතල ලෙස අඩන්තේට්ටම් වලට ලක්කරන ලදින්, ඔහුගේ සිරුර පුරා තුවාල තිබුණි.

(ඇ) පිරිමි තිදෙනකුගෙන් සමන්විත කණ්ඩායමක්, දහසයවියැති "X" නම් දැරිය පැහැරගෙන ගොස්, ඝාතනය කළෝය. පොලිසිය විසින් සැකකරුවන් අත්අඩංගුවට ගත් අතර, නීතිපතිවරයා සැකකරුවන්ට එරෙහිව අධිචෝදනා පත්‍ර ගොනුකිරීමට බලාපොරොත්තු වෙයි.

(ඇ) කවිතා, විධායක බැංකු නිලධාරිනියක් වශයෙන් කීර්තිමත් පුද්ගලික බැංකුවක සේවයට අනුයුක්තව සිටී. ඇගේ තනතුර ස්ථිර ස්වභාවයෙන් යුත් එකකි. ඇගේ සයමස් වියැති බිළිඳා හට, මව්කිරි ලබා දීම සඳහා ඇයට හිමි කාලය ලබාදීම ඇගේ කළමණාකරු විසින් ප්‍රතික්ෂේප කළ අතර, ඉන්පසුව, මානව සම්පත් ප්‍රධානියා විසින් ඇය වෙත සේවය අවසන් කිරීමේ ලිපියක් නිකුත් කළේය.

(ඉ) කමල් විසින් ඔහුගේ අසල්වැසියකු වන විමලාගේ රු. 100,000 ක වටිනාකමින් යුත් ස්වර්ණාභරණ සොරකම් කර ඇතිබව, පොලිස් පරීක්ෂණ වලදී අනාවරණය වී තිබුණි. කමල්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා පොලිස් නිලධාරීන්ට උපදෙස් ලැබී ඇත.

******************